කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **06** MSW/26/09/21/03
වර්ණය : රතු

## තද සුළං සහ මුහුද රළුවීම පිළිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
**ඉදිරි පැය 12 සඳහා වලංගු වන පරිදි, 2026 සැප්තැම්බර් මස 21 දින ප. ව. 10.00 ට නිකුත් කරන ලදී.**

## බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශයේ යාත්‍රාකරන බහුදින ධීවර යාත්‍රා සඳහා.


**ක්‍රියාත්මක වන්න!**

**බටහිර-මධ්‍යම සහ ඊට යාබද නැගෙනහිර-මධ්‍යම බෙංගාල බොක්ක ආශ්‍රිතව පැවති අඩු පීඩන කලාපය බටහිරට බරව වයඹ දෙසට ගමන් කර, අද (2026 සැප්තැම්බර් 21) ශ්‍රී ලංකා වේලාවෙන් සවස 05:30 වන විට බටහිර-මධ්‍යම සහ ඊට යාබද වයඹදිග බෙංගාල බොක්ක ආශ්‍රිතව 'පීඩන අවපාතයක්' දක්වා වර්ධනය විය. ඉදිරි පැය 24 තුළ එය බටහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් බටහිර-මධ්‍යම සහ ඊට යාබද වයඹදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ ආශ්‍රිතව 'ගැඹුරු පීඩන අවපාතයක්' දක්වා තවදුරටත් වර්ධනය වීමට ඉඩ ඇත. ඉන්පසු එය බටහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් උතුරු ආන්ද්‍ර ප්‍රදේශ් සහ දකුණු ඔඩිෂා වෙරළ තීරය හරහා ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**

**පහත සිතියමේ "Advisory" කාණ්ඩය යටතේ ලකුණු කරඇති මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (55-65) දක්වා වැඩි වන අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු හෝ ඉතා රළු වේ.**

**පහත සිතියමේ "Warning" කාණ්ඩය යටතේ ලකුණු කර ඇති මුහුදු ප්‍රදේශවල, ගිගුරුම් සහිත තද වැසි ඇතිවන අතර, සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 70 දක්වා වැඩි වීමත් සමග එම මුහුදු ප්‍රදේශ ඉතා රළු වේ.**
**උතුරු අක්ෂාංශ 5 ත් 22ත් සහ නැගෙනහිර දේශාංශ 85ත් 100ත් අතර මුහුදු ප්‍රදේශවල, නැවත දැනුම් දෙනතුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ. මේ වනවිට එම ප්‍රදේශයේ ධිවර කටයුතුවල යෙදී සිටී නම් එම මුහුදු ප්‍රදේශ වලින් ඉවත්වන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.**

**Advisory for Fishing and Naval Communities.**
**Issued at 10.00 p.m. on 21 September 2026. Valid for the period until 10.00 a.m. 22 September 2026.**




**ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිළිබඳව අවධානයෙන් පසුවන ලෙසත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉදිරි නිවේදන සහ අනාවැකි සම්බන්ධයෙන් විමසිලිමත් වන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.**